*ස්වයං අධ්‍යනයට අත්වැලක්*

1. ශ්‍රේණිය - 11
2. වාරය - 3
3. නිපුණතා මට්ටම - 2.4 රස හා භාව විස්තර කරයි.
4. ක්‍රියාකාරකම - 2.4 රස හා භාව හඳුනා ගනිමු.



සැකසුම - මනෝජා කිතුල්ගස්තැන්න මිය
මප/වත්/පිලවල මහා විද්‍යාලය.

මෙහෙයවීම - නර්තන අංශය,
කලාප අධ්‍යාපන කාර්යාලය,
වත්තේගම.

උපදෙස් - මෙය ලිඛිත පාඩමකි. මෙම පාඩම වැඩිදුරටත් අධ්‍යනය කිරීම සඳහා පාසලේ ගුරු ඇසුර ලබා ගත යුතුය.

*හැඳින්වීම -*

යම් රංගකාර්යකදී, රසභාව නිරූපණය පිළිබඳව 6 ශ්‍රේණියේ සිට10 ශ්‍රේණිය දක්වා වෙන් වෙන් වශයෙන් අප ඉගෙන ගෙන ඇත්තෙමු. එහිදී ශෘංගාර, වීර, භයානයක, කරුණ හා අද්භූත රස පිළිබඳව අධ්‍යනයය කළෙමු. ඒ අනුව රස හා භාව පිළිබඳ සාකච්ඡා කෙරෙන, නවනළු රසය පිළිබඳව මෙම පාඩමෙන් සවිස්තරාත්මක තොරතුරු අධ්‍යයනය කිරීමට ඔබට අවස්ථාව හිමිවේ.

# රසභාව



## භාව යනු

- ✓ පුද්ගලයෙකු කිසියම් සංසිද්ධියක් කෙරෙහි, තම පංචේන්ද්‍රියන් සංවේදී වූ කල ප්‍රථමයෙන්ම අවධි වන්නේ භාවයයි. ස්ථාවර ( ස්ථිරව පවතින) හැඟීම් සමුදායක් ලෙස පුද්ගල මනසෙහි නිධන්ගතව පවත්නා හෙයින් මෙකී භාවයන් ස්ථායී භාව ලෙස හඳුන්වයි.

- ✓ ස්ථායි භාව සෑම පුද්ගලයෙකුගේම සිත තුළ නිදන්ගතව, නිද්‍රාශීලීව පවතින හැඟීම් සමුදායකි. ස්වභාවයෙන්ම මිනිසා විසින් යටපත් කරගෙන සිටින මෙම හැඟීම් සමුදාය පංචේන්ද්‍රියන් ගේ ග්‍රහණයට හසුවන සංසිද්ධියකදී අවදි වෙයි.

  උදා - හාස්‍ය උපදවන අවස්ථාවකදී ඔබ සිනාසීමට පෙළඹෙන්නේ ඔබේ පංචේන්ද්‍රියන්ගේ කවර හෝ ඉන්ද්‍රියක් ( ඇස, කන) එකී අවස්ථාව කෙරෙහි සංවේදී වීම නිසා හාස නමැති භාවය පිබිදීම හේතු කොටගෙනයි.

## රස යනු

✓ සොබාදහම මගින් නිර්මාණය කරනු ලැබුවා වූ සෞන්දර්යාත්මක වස්තූන්, සංසිද්ධි හා කලා කෘතීන් කෙරෙහි පුද්ගලයෙකුගේ පංචේන්ද්‍රියන් සංවේදී වීම කරණ කොටගෙන එම පුද්ගලයාගේ මනසෙහි ඇතිවන ආස්වාදජනක මනෝ භාවයන් මගින් ඇති කරනු ලබන්නාවූ හැඟීම් සමූහය රසයක් ලෙස හඳුන්වයි.

- ජීවිතයේ විවිධ අවස්ථා අනුව මිනිසා තුළ ඇති වන විවිධාකාර හැඟීම් රස භාව ලෙස දැක්විය හැකිය. භාරතීය නර්තන සම්ප්‍රදායන් තුළ මෙම රස භාවයන් ගැඹුරින්ම අන්තර්ගත වේ.
- දේශීය නර්තන සම්ප්‍රදායන් තුළද මෙම රසභාව යම් පමණකට දැකිය හැකි අතර, නව නාළ රසය ලෙස අද්‍යතනයේදී කලාව තුළ මෙය ව්‍යවහාර වෙයි.
- සිතේ ඇතිවන භාව ස්ථායී භාව නමින් හැඳින්වෙන අතර, ඒවා රස නිෂ්පත්තියට මුල් වේ. රසයෙන් තොරව භාවයත්, භාවයෙන් තොරව රසයත් ඇති නොවේ. ඒ අනුව රස හා භාව එකිනෙකට බද්ධව පවතින අතර, සියලු රස හා භාව ස්ථායී භාව මත පවතී.

# රස භාව සංකල්පය

- රස සිද්ධාන්තය පිළිබඳ පෙරදිග හා අපරදිග දාර්ශනිකයින් විවිධ ලෙස විග්‍රහ කර ඇති අතර ඒ අතරින් පෙරදිග දාර්ශනිකයන් වන නන්දිකේශ්වරයන්ගේ අභිනය දර්පණයේ හා භරත මුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේ විග්‍රහ කර ඇත්තේ විවිධ සාහිත්‍යමය අවස්ථා අනුව මිනිසාට ඇතිවන හැඟීම් රසභාව බවයි.
- රසභාව බහුල ලෙස භාරතීය නර්තන සම්ප්‍රදායයන් හි භාවිත කරයි.
- ආරම්භයේදී භරත මුනිගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි රස අටක් ඇතුළත්ව පැවති අතර, එම රස අටට ශාන්ත රසය එක් වීමෙන් රස නවයක් බවට පත්විය.
- රස නිෂ්පත්තියේදී මුල් වන ස්ථායී භාව නවයකි. පංචේන්ද්‍රියන්ගේ ග්‍රහණයට හසුවන කවර හෝ සංසිද්ධියකදී ප්‍රථමයෙන් ම අවදි වන්නේ ස්ථායී භාවයයි.මෙම ස්ථායී භාවයන් අවස්ථානුරූපීව වෙනස් වන අතර, එමඟින් රස ජනනයක් සිදු වෙයි.

උදාහරණ - : ශෝක ජනක සිදුවීමකදී ඔබේ සිතටද දුකක් දැනිය හැකිය. එසේ ඔබට දුකක් දැනෙනුයේ එම අවස්ථාව ඔබේ පංචේන්ද්‍රියන් මගින් ග්‍රහණය කර ගැනීම නිසා ඔබ සිතේ නිද්‍රාශීලීව සිටි ශෝක නමැති භාවය අවදි වීම නිසයි. එය අවදි වීමට හේතුවක් වූයේ , එකී අවස්ථාවට අදාළ සංවාද සහ සිදුවීම් ඔබේ ඇස සහ කන යන ඉන්ද්‍රියයන්ට උත්තේජකයක් වූ බැවිනි.

# නව නළු රසය හා ස්ථායී භාව

| | ස්ථායී භාවය | රසය |
|---|---|---|
| 1 | රති | ශෘංගාරය |
| 2 | හාස | හාස්‍ය |
| 3 | ශෝක | කරුණ |
| 4 | ක්‍රෝධ | රෞද්‍ර |
| 5 | උත්සාහ | වීර |
| 6 | භය | භයානක |
| 7 | ජුගුප්සා | බීභත්ස්‍ය |
| 8 | විස්ම | අද්භූත |
| 9 | ශාන්ත (ශම) | ශාන්ත |

# ස්ථායි භාව රස බවට පත්වීම

- පරිසරයේ දක්නට ලැබෙන විවිධ වස්තු හා කලා කෘති යම් යම් සංසිද්ධීන් සමඟ ගැටීමෙන් සාමාන්‍ය ජීවිතයේදී සිත තුළ යටපත් ව තිබෙන්නාවූ ස්ථායී භාව අවදි වේ.

  උදා -:බුදු රුවින් දිස්වන්නේ ශාන්ත භාවයයි. බුදු රුව දකින අප තුළ තැන්පත්ව තිබූ ශාන්ත (ශම) ස්ථායී භාවය අවදිව බුදු රුවෙන් දිස්වන භාවයද සමඟ සුසංයෝගී වී අවසානයේ රසයක් බවට පත්වේ.

- පරිසරයේ විවිධ ශබ්ද ඇති වේ. ඒ අනුව ඇතිවන සිතුවිලි වෙනස් වෙයි. හෘද ස්පන්දන වේගයද ක්‍රමයෙන් අඩු වැඩි වෙයි. එම අවස්ථාවෙන් මිදුණු විට එය සාමාන්‍ය දෙයක් බවට ද පත් වෙයි. එවිට මුහුණෙහි හැඟීමද ඊට අනුරූපීව වෙනස් වෙයි. මේ අනුව මෙම සංසිද්ධිය පාදකව මුහුණෙන් මතු වන්නාවූ භාව විවිධාකාර වේ.

මෙම භාව ඉස්මතු වීමේදී මුහුණේ ඉරියව්වල විවිධත්වයක් ඇති වීම සඳහා උපාංගයන්ගේ සුවිශේෂ වෙනස්වීමක් සිදුවේ.

# රස හා භාව නිරූපණය

## ශෘංගාර රසය

| ශෘංගාර රසය | අවස්ථා | මුහුණේ ඉරියව් හා ශාරීරික වෙනස්කම් |
| --- | --- | --- |
| රතිය නමැති භාවය මුල්කොටගෙන ශෘංගාරය උපදී. ශෘංගාරය බොහෝ විට ස්ත්‍රී පුරුෂයින් අතර පවත්නා ප්‍රබෝධය, සම්බන්ධය, කැමැත්ත මත සිදුවෙයි. | සතුට. මල්දම්, ආභරණ, මධුර ස්වරය, රමණීය වස්තූන් දැකීම, පෙම්කෙළි, ආදරය...... | ඇහිබැම ඉහළට යාම,ඇස් ප්‍රාණවත් වීම, තොල් දෙක දෙපසට විහිදීම, කම්මුල් ඉහළට ඉස්සීම..... |



## හාස්‍ය රසය

| හාස්‍ය රසය | අවස්ථා | මුහුණේ ඉරියව් හා ශාරීරික වෙනස්කම් |
|---|---|---|
| හාස නමැති භාවය මුල්කොට ගෙන හාස්‍ය රසය උපදී. යම්කිසි රංගනයක්, නර්තනාංගයක් ඉදිරිපත් කරන ආකාරය අනුව ප්‍රේක්ෂකයාට සිනහා ඉපදේ නම් ඒ හාස්‍ය රසයයි. | භාෂාව වැරදි ලෙස හැසිරවීම, සිතා මතා අර්ථ විකෘති කිරීම, විකාර රූපී හැසිරීම්, සටකපටකම්, …….. | දෑස කුඩා වී දීප්තිමත් වීම, මුව සිනහාවෙන් පිරීම, කම්මුල් ඉස්සීම……. |



## කරුණා රසය

| කරුණා රසය | අවස්ථා | මුහුණේ ඉරියව් හා ශාරීරික වෙනස්කම් |
|---|---|---|
| ශෝකය නමැති ස්ථායි භාවය මුල් කරගෙන කරුණා රසය උපදී. ප්‍රිය ජනකයින් දුකට පත් වීම, අප්‍රියජනක දේ අසන්නට ලැබීම හා දකින්නට ලැබීම වැනි අවස්ථා නැරඹීමෙන් ප්‍රේක්ෂකයා තුළ ශෝකාත්මක හැඟීමක් පහළ වන්නේ නම් ඒ කරුණා රසයයි. | සිත කම්පා කරවන සිදුවීමක් දකින්නට හෝ අසන්නට ලැබීම, සමීප කෙනෙකුගේ වියෝව..... | දෑස් අඩවන් වීම, නළල යම් ප්‍රමාණයකට රැළි වැටුණු ස්වරූපයක් ගැනීම, කම්මුල් හැකිළීම, කඳුළු සැලීම.... |



රෞද්‍ර රසය

| රෞද්‍ර රසය | අවස්ථා | මුහුණේ ඉරියව් හා ශාරීරික වෙනස්කම් |
| --- | --- | --- |
| ක්‍රෝධ නමැති ස්ථායි භාවය මුල් කරගෙන රෞද්‍ර රසය උපදියි. පළි ගැනීම්, තැළීම් පෙළීම්, පහර දීම්, කපා කොටා දැමීම වැනි දර්ශන මුල්කර ගෙන ප්‍රේක්ෂකයා තුළ සාධාරණ කෝපයක් ඇති කෙරේ නම් ඒ රෞද්‍ර රසයයි. | පළිගැනීම්, තැළීම් පෙළීම්, පහරදීම්, කපා කොටා දැමීම්, යුද ගැටුම්, පහර දීම්, වද හිංසා......... | දෑස් විශාල වීම, දත් හා තොල් තද වීම, මුහුණේ මාංශපේශී තද වී, වෙව්ලීම..... |



## වීර රසය

| වීර රසය | අවස්ථා | මුහුණේ ඉරියව් හා ශාරීරික වෙනස්කම් |
|---|---|---|
| උත්සාහ නමැති භාවයෙන් වීර රසය උපදී. යම් රංගනයක්, නර්තනයක් දැකීමෙන් ප්‍රේක්ෂකයා තුළ උත්සාහය, ධෛර්යය ඇති වන්නේ නම් ඒ වීර රසයයි. | උත්සාහය, ධෛර්ය, උකටලී නොවීම ආදිය ඇතුළත් සිදුවීම්......... | තොල් තදින් හකුළා ගැනීම, ඇස් කුඩා කිරීම, දත් ඇඳි එකට තද කිරීම, කම්මුල් දෙපසට විහිදීම, මස් පිඬු තද වීම, මිට මොළවා ගැනීම..... |



## භයානක රසය

| භයානක රසය | අවස්ථා | මුහුණේ ඉරියව් හා ශාරීරික වෙනස්කම් |
|---|---|---|
| බිය යන ස්ථායී භාවය මුල් කරගෙන භයානක රසය උපදී. භූත දර්ශන, පාළු ස්ථාන, අමු සොහොන් වැනි ස්ථාන දර්ශනය වීමෙන් හා භයානක ශබ්ද ඇසීමෙන් ප්‍රේක්ෂකයා තුළ බියක් හට ගනී නම්, ඒ භයානක රසයයි. | විකාර ශබ්ද, භූත දර්ශන, පාළු ස්ථාන, අමු සොහොන් වැනි තැන්වලට තනිව ප්‍රවේශ වීම, කරදරයකට පත්වීම, ( දියේ ගිලීම, රිය අනතුරක්, හිරිහැරයක්) මිනිස් සත්ත්ව ගැටුමක්, භයානක සත්ත්වයෙකු දැකීම ....... | ඇස් විශාලවීම හා ඇස් බෝලය දෙපසට ගමන් කිරීම, අත් පා දරදඬු වීම, මුව විවර වීම, උරහිස් බෙල්ල හැකිළීම |



## බීබත්සා රසය

| බීබත්සා රසය | අවස්ථා | මුහුණේ ඉරියව් හා ශාරීරික වෙනස්කම් |
|---|---|---|
| ජුගුප්සා නමැති ස්ථායි භාවය මුල් කරගෙන බීබත්සා රසය උපදී. දර්ශන, ශබ්ද, ගන්ධ රස, ස්පර්ශ වැනි අප්‍රියජනක දේ, පිළිකුල දනවන දේ දැකීම, ඇසීම මගින් ප්‍රේක්ෂකයා තුළ ඇතිවන රසය බීබත්සා රසයයි. | දර්ශන, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ වැනි ආකාරයෙන් අප්‍රියජනක දේ, පිළිකුල් සහගත දේ ඇසීමෙන් හා දැකීමෙන්........ | මුහුණ හැකිලේ, දෙතොල් තද වේ, නාසය හකුළා ගනී, නළල රැළි වැටේ. |



*අද්භූත රසය*

| අද්භූත රසය | අවස්ථා | මුහුණේ ඉරියව් හා ශාරීරික වෙනස්කම් |
|---|---|---|
| විස්මය නමැති ස්ථායී භාවය මුල් කරගෙන අද්භූත රසය උපදී. යම් රංගයක හෝ නර්තනයක ඉදිරිපත් කරන්නාවූ දෙයින් ප්‍රේක්ෂකයා තුළ පුදුමයත්, විස්මයත් ඇති කරවන්නේ නම් ඒ අද්භූත රසයයි. | නුහුරු නුපුරුදු අත්දැකීම්වලට මුහුණ දීම, ඇදහිය නොහැකි වූ සිද්ධීන්ට මුහුණ දීම ....... | ඇස් පළල් කිරීම, ඇසිපිය නොහෙළා බලා සිටීම, කඳුළු සැලීම, ප්‍රීතිය ප්‍රකාශ කිරීම, ගල් ගැසුනාක් මෙන් නිශ්චලව සිටීම, ගොත ගැසීම. |



*ශාන්ත රසය*

| ශාන්ත රසය | අවස්ථා | මුහුණේ ඉරියව් හා ශාරීරික වෙනස්කම් |
|---|---|---|
| ශාන්ත (ශම) නමැති ස්ථායී භාවය තුළින් ශාන්ත රසය උපදී. යමක් ඇසීමෙන් , දැකීමෙන් සිතෙහි ශාන්තමය ස්වභාවයක් ඇති වීම මෙහි ලක්ෂණය වේ. ඉතා නිවුණු, දැමුණු ගතිගුණ, සාමකාමී, උපශාන්ත දර්ශන දුටුවිට (සමාධි පිළිමය) අප තුළ ඇති වනුයේ ශාන්ත රසයයි. | ආගමික භක්තිය දනවන ගිත ඇසීම, ආගමික සිද්ධස්ථානයකට ප්‍රවේශ වීම, බුදුරජාණන් වහන්සේ, දෙවියන් වැනි දර්ශන දැකීමෙන්......... | ඇස් අඩවන් වීම හෝ දැස් පියා ගැනීම. දෙතොල් වැසීම, එක ඉරියව්වක පිහිටීම, සංයමයෙන් ක්‍රියා කිරීම |



## නවනළු රස- සංස්කෘත ශ්ලෝකය

ඔබට රස භාව නම් කිරීමට ලිඛිත පරීක්ෂණවලදී ලැබෙන අතර, රසභාව පහසුවෙන් මතකයේ රඳවා ගැනීමට අත්වැලක් ලෙස මෙම ශ්ලෝකය ඉදිරිපත් කරමි. (එය ඔබට අවශ්‍යයැයි හැඟේ නම් පාඩම් කරගන්න.)

ශෘංගාර හාස්‍ය කරුණා
රෞද්‍ර වීර භායානක:
භීභත්සාත්භූත ශාන්තස්‍ය
නව නාට්‍ය රසාත්මෘත:

(ශෘංගාර , හාස්‍ය, කරුණා
රෞද්‍ර, වීර, භයානක
බීබත්ස්‍ය, අද්භූත, ශාන්ත)